AL/2022(2023)/71/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022(2023)

සිංහල II
சிங்களம் II
Sinhala II

**71 S II**

පැය තුනයි
*மூன்று மணித்தியாலம்*
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

විභාග අංකය : ..........................

**උපදෙස්:**

* **I** කොටසේ **1** ප්‍රශ්නය ද, **II** කොටසේ **2, 3** ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* **1** ප්‍රශ්නයේ ඇති **සියලු ම** අනුකොටස්වලට මේ **ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
* **I** කොටස, **II** කොටසේ පිළිතුරු පත් සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

**1.** එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන, **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1 මූර්ධජ අක්ෂර පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) ඍ ට ඨ ශ ඵ ළ ණ
(2) ට ඍ ප ර ණ ස ළ
(3) ශ ර ඍ ට ඩ ණ ළ
(4) ඍ ට ඨ ඩ ණ ර ෂ
(5) ළ ණ ට ඩ ශ ඍ ර (......)

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

(1) රශාස්වාදය, සඳළුතළය, විෂ්ලේෂණය, කාලගුණය, ග්‍රන්ථධුර
(2) රෂාස්වාදය, සඳළුතලය, විශ්ලේශණය, කාලගුනය, ග්‍රන්තධුර
(3) රසාස්වාදය, සඳලුතලය, විශ්ලේෂණය, කාලගුණය, ග්‍රන්ථධුර
(4) රසාස්වාදය, සඳළුතලය, විස්ලේෂණය, කාළගුණය, ග්‍රන්ථදුර
(5) රශාශ්වාදය, සඳලුතලය, විෂ්ලේශනය, කාළගුනය, ග්‍රන්ථධුර (......)

1.3 අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) සද්ධර්මරත්නාවලිය, සද්ධර්මාලංකාරය, සැළලිහිණිය, සාරාර්ථ සංග්‍රහය, සුභාෂිතය
(2) සද්ධර්මරත්නාවලිය, සද්ධර්මාලංකාරය, සාරාර්ථ සංග්‍රහය, සැළලිහිණිය, සුභාෂිතය
(3) සද්ධර්මාලංකාරය, සැළලිහිණිය, සද්ධර්මරත්නාවලිය, සුභාෂිතය, සාරාර්ථ සංග්‍රහය
(4) සද්ධර්මරත්නාවලිය, සුභාෂිතය, සාරාර්ථ සංග්‍රහය, සැළලිහිණිය, සද්ධර්මාලංකාරය
(5) සද්ධර්මාලංකාරය, සැළලිහිණිය, සුභාෂිතය, සද්ධර්මරත්නාවලිය, සාරාර්ථ සංග්‍රහය (......)

1.4 පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) යංශය සැම විට ම ව්‍යඤ්ජනයක් හා සංයෝග ව ම යෙදේ.
(2) පදයක ආරම්භයෙහි යංශය යෙදිය හැකි ය.
(3) යංශය ඕනෑ ම ව්‍යඤ්ජනයකට පසු ව යෙදිය හැකි ය.
(4) යංශය සමග රකාරාංශය භාවිත වෙයි.
(5) 'ය' වෙනුවට 'ය' ද, 'ය' වෙනුවට 'ය' ද යෙදේ. (......)

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

(1) ශිෂ්‍ය කේන්ද්‍රීය, නිෂේධ බලය, ඉන්ධන හිඟය, මිනිස් ප්‍රජාව
(2) ආක්‍රමණික ශාක, පැරණි සිද්ධස්ථාන, මාපිය උපහාර, ග්‍රහලෝක තරණය
(3) සත්ත්ව හිංසා, ගැමි දිරිය, ආරක්ෂක අමාත්‍යාංශය, කොවුල් සදෙස
(4) යුද භූමිය, මංගල ගමන, නිවාස සැලසුම, වෛද්‍ය පරීක්ෂණය
(5) ජනපති මැඳුර, උදා වැනුම, භෞතික සැප, දවල් ආහාරය (......)

[දෙවැනි පිටුව බලන්න.

1.6 තත්සම පද පමණක් යෙදී ඇති වරණය කුමක් ද?
(1) ප්‍රකෘති, විකෘති, ආකෘති, සංස්කෘති
(2) ධන, ධාතු, දළ, ධර්ම
(3) මාර්ග, වර්ග, සඟ, දුර්ග
(4) වාරණ, කාරණ, පැරණි, තීරණ
(5) භාර, භාග, භාග්‍ය, බැම (......)

1.7 තද්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) කම්, දම්, ධූම, ප්‍රේම
(2) වක, සක, දුක, ශෝක
(3) පස, දශ, විෂ, දෙස
(4) අඟන, තුරඟ, අඟුරු, රංගන
(5) සුමිතුරු, ලොව්තුරු, පිවිතුරු, වෙසතුරු (......)

1.8 අන්‍යාර්ථ, විභක්ති, අව්‍යය සහ විශේෂණ යන සමාස පද අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
(1) දසබල, තැඹිලිතෙල්, දුබල, නිල්මානෙල්
(2) තැඹිලිතෙල්, දුබල, දසබල, නිල්මානෙල්
(3) දුබල, නිල්මානෙල්, දසබල, තැඹිලිතෙල්
(4) තැඹිලිතෙල්, දසබල, දුබල, නිල්මානෙල්
(5) දසබල, දුබල, තැඹිලිතෙල්, නිල්මානෙල් (......)

1.9 කෘදන්තයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) නිදන, කඩන, පතන, දුවන
(2) විසිරි, පැතිරි, ඉහිරි, වැතිරි
(3) පැනීම්, දිවීම්, ලිවීම්, බැලීම්
(4) ඉවසිලි, මැතිරිලි, පෙරළිලි, ගෙරවිලි
(5) පිපුණු, වැටුණු, දරුණු, ගැටුණු (......)

1.10 පහත දැක්වෙන උද්ධෘතවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(අ) "**දිවි** රන්වන් කැලුම් එක විට "
(ආ) "දුබික් දුක් දුරු **වේවා**"
(ඉ) "**නොවසව** තෙපි මවෙත"
(ඊ) "**අවුත්** බෝසත්හු දිනවන ලෙස"

(1) විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, අතීතකාල ක්‍රියා, ආශීර්වාද ක්‍රියා
(2) පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, අතීතකාල ක්‍රියා
(3) ආශීර්වාද ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, අතීතකාල ක්‍රියා
(4) අතීතකාල ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා
(5) අතීතකාල ක්‍රියා, පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, ආශීර්වාද ක්‍රියා (......)

1.11 තද්ධිතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) දැවමුවා, රිදීමුවා, සෙල්මුවා, රන්මුවා
(2) සිහිලස්, වරලස්, අල්ලස්, මුහුළස්
(3) ධනවත්, කුලවත්, ආශ්චර්යවත්, භාග්‍යවත්
(4) කිනිති, කඩිති, සිඟිති, පැනිති
(5) කෞශල්‍යය, සෞභාග්‍යය, වෛකල්‍යය, සෞඛ්‍යය (......)

1.12 උපසර්ගයක් යෙදී නැති පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) පිළිසඳර, පිළිමල්, පිළිකුල්, පිළිබඳ
(2) අවතැන්, අවගුණ, අවමන්, අවමඟුල්
(3) කුදිටු, කුකවි, කුලුඳුල්, කුපුරිස්
(4) අනුගත, අනුකූල, අනුමාන, අනුදැනුම
(5) විකාල, විරූප, විගමන, විදේශ (......)

1.13 නිපාතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) විසින්, පිණිස, කෙරෙන්, කෙරෙහි
(2) හෝ, අහෝ, අනේ, අපොයි
(3) එපා, නැවත, නොහොත්, හෙවත්
(4) එදා, අද, දවස, හෙට
(5) ද, ම, නො, හා (......)

1.14 "**කෝකිලනාදය** අසා ප්‍රමුදිත වූ **වරාංගනාවෝ අසිරිමත්** වනසිරි වින්දාහ" යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන්** දක්වා ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?
(1) තද්ධිත, සන්ධි, සමාස
(2) සන්ධි, තද්ධිත, සමාස
(3) තද්ධිත, සමාස, සන්ධි
(4) සමාස, සන්ධි, තද්ධිත
(5) සමාස, තද්ධිත, සන්ධි (......)

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.
(1) නෙළන්නී, දෙන්නී, කොටන්නෝ, අඹන්නී
(2) එව, කව, බොව, යවු
(3) කියනුව, බලනුව, අසනුව, හඬනුව
(4) පිහිනත, කරතොත්, නටත, බලත
(5) කවා, පොවා, නාවා, කියා (......)

1.16 සමාසයක් **නොවන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) දොරජනෙල්, ඇඳපුටු, ගොඩමඩ, පින්පව්
(2) අදහම්, අරුත්, අසුබ, අවැඩ
(3) සුවඳදුම්, රතුඑළිය, දුරගමන්, කහටරස
(4) පසිඳුරෝ, සදිසා, සිවුකොන්, සත්සමුදුර
(5) රන්තෝඩු, දඬුවැට, ගල්පිළිමය, වැව්මාළු (......)

1.17 එක ම වර්ගයට අයත් සන්ධි පද ඇතුළත් වරණය තෝරන්න.
(1) පුනරාගමනය, විදුරවි, නිරාකුල, දුරාචාර
(2) දේවාසුර, කුශලාකුශල, පාපොච්චාරණය, සත්‍යාසත්‍ය
(3) අංගෝපාංග, පූජෝපහාර, ශබ්දෝච්චාරණ, ප්‍රබන්ධෝපදේශ
(4) පිනැති, දහම්සුරු, දිවැස්, බුදුකුරු
(5) සිතැති, දිනැති, නෙතැති, බලැති (......)

1.18 ව්‍යාකරණානුකූල ව **නොගැළපෙන** වරණය කුමක් ද?
(1) දුර්ගුණ, වර්ණනා, නිර්මාණ, නිර්ණායක
(2) බලවමින්, ලියවමින්, නටවමින්, හඬවමින්
(3) මින්මැදුර, දන්සැල, සාරිරෙදි, පින්පෙට්ටිය
(4) සුසිනිඳු, සුවිසල්, සුපසන්, සුනිමල්
(5) බලන්න, අසන්න, සිටින්න, නගින්න (......)

1.19 ව්‍යාකරණානුකූල ව නිරවද්‍ය වාක්‍යය තෝරන්න.
(1) සියලු ක්‍රීඩකයන් පිට්ටනිය පුරා විසිරී ගියහ.
(2) උත්සව සභාවට ආගමික නියෝජිතයන් ද පැමිණෙති.
(3) ගුණපාල ද සිරිපාල ද අප පාසලේ ගුරුවරු ය.
(4) දියණියෝ බුදුපුදට සැරසුණා ය.
(5) ඔවුහු සංගමයේ ක්‍රියාකාරීහු මෙන් ම එහි පැවැත්මට වගකිව යුත්තෝ ද වෙති. (......)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.
(1) ඇති යාන්තං මේ පැත්තේ ඇවිත් යන්න ආවා.
(2) කාගේ කාගෙත් කිල්ලෝටවල හුණු ටික ටික තියෙනවයි කියන්නේ.
(3) හද්දොහේ මඟුල් කාලා මං ඒකි කැන්දන් එන්නේ.
(4) මාමණ්ඩිත් එක්ක පැල් කොටේට යන්න බැනා හරි මනාප යි.
(5) දෙමාපියන්ගේ යුතුකම වන්නේ දරුවන්ගේ සිත් තුළ පරිසරය ගැන ඇල්ම වැඩි කිරීම යි. (......)

(ලකුණු 20 යි.)

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022(2023)

සිංහල II
சிங்களம் II
Sinhala II

71 S II

## II කොටස

- මෙම කොටසින් **2, 3** ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න **සතරකට** පමණක් පිළිතුරු සපයන්න.

**2.** (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඉතා පුළුල් ලෙස අරුත් දක්වතොත් කාර්මික අධ්‍යාපනය යනුවෙන් අදහස් කැරෙනුයේ ප්‍රජා අවශ්‍යතා සපුරාලන වෘත්තීය කාර්යයන් කාර්යක්ෂම ව කළ හැකි වන සේ ජනයාගේ කුසලතා වර්ධනය කිරීම යි. මේ කුසලතා පරපුරින් පරපුරට ලබා දීම කාර්මික අධ්‍යාපන පටිපාටියට ඇතුළත් ය. සමාජ-ආර්ථික තත්ත්වයත් රටේ කාර්මික විද්‍යාවත් විවිධ ශිල්පත් දියුණු වී තිබෙන ප්‍රමාණය වැනි සාධක කිහිපයක් ම කවර අවස්ථාවේ දී වුවත් රටේ කාර්මික අධ්‍යාපනයේ ස්වභාවය නිගමනය කිරීමට අදාළ වේ. නිෂ්පාදන පරිමාව කුඩා වූ ද දේශීය අවශ්‍යතා සපුරා ලීමට මුළුමනින් ම සකස් කරන ලද ශිල්පක්‍රම බෙහෙවින් සරල ව ද පැවති කල්හි භාණ්ඩ නිෂ්පාදනය ප්‍රමුඛ ශිල්පීන්ගේ නිවෙස්බද කම්හලට සීමා විය. එබැවින් කාර්මික අධ්‍යාපනය දීමේ පිළිවෙත ද ශාස්ත්‍රීය දැනුම දුන් පිළිවෙතට සමාන විය. අතවැසියා (ආධුනිකයා) ප්‍රමුඛ ශිල්පියාගේ සෙවණෙහි විසී ය. ඔහු ස්වාමියාගේ ගෙදර දොරේ වැඩපලට උදවු වෙමින් ද කම්හලේ වැඩට සහාය වෙමින් ද ශිල්පක්‍රම සහ ගුරුමුෂ්ටි උගත්තේ ය. මේ අතර තම සමාජ තත්ත්වයට සරිලන ජීවන දර්ශනයක් හා ජීවන ක්‍රමයක් ඇති කර ගත්තේ ය. පාරම්පරික රටාවක පැවති කාර්මික අධ්‍යාපනයෙන් ලබාදිය නොහැකි වූ විවිධ දක්ෂතා සමූහයක් අවශ්‍ය බව පෙනී ගියේ භාණ්ඩ නිෂ්පාදනය සඳහා ජව බලය යෙදවීමත් කාර්මික සංවර්ධනයත් හේතු කොට ගෙන ය.

දේශපාලනය සහ ආර්ථික අංශවල ඇති වුණු වෙනස්වීම් සමාජ ක්‍රමය කෙරෙහි බලපායි. මේ බලපෑම බාල පරපුරේ අධ්‍යාපනය සඳහා ඇති කරනු ලබන අධ්‍යාපන ආයතනවලින් පිළිබිඹු වේ. ඉකුත් සියවස මැද භාගයේ දී බ්‍රිතාන්‍යයන් තම දේශපාලන බලය මෙහි තහවුරු කළේ වඩා කාර්යක්ෂම පාලන ක්‍රමයක් මඟිනි. එහි ලා උපයෝගි කර ගන්නා ලද බලගතු ආයුධය අධ්‍යාපනය යි. බටහිරින් ආභාසය ලත් අධ්‍යාපන ක්‍රමය නිසා චිරන්තන ගුරු-ගෝල පිළිවෙත වෙනුවට පාසැල් ගුරුවරයකු යටතේ විශාල ශිෂ්‍ය පිරිසකට පන්ති කාමරයක ඉගැන්වීමේ පිළිවෙත බිහි වූයේ ය. මේ පිළිවෙත එංගලන්තයේ පැවති අධ්‍යාපන ක්‍රමය අනුව සකස් කරන ලද්දේ ය. මෙහි විෂය මාලාව ද ජනතාවගෙන් විශාල කොටසකගේ අවශ්‍යතා හා මනා ලෙස සම්බන්ධ නො වී ය.

වඩා ප්‍රායෝගික වූ අධ්‍යාපනයක් දීමට මුලින් ම තැත් කරන ලද්දේ මිෂනාරි සංවිධාන විසිනි. ඔවුහු සාමාන්‍ය අධ්‍යාපනය උදෙසා වියදම් දැරීමට නොහැකි දුප්පත් පන්තිවල ළමයිනට යම් ශිල්පයක් පුහුණු කිරීම පිණිස 'කාර්මික පාසැල්' ආරම්භ කළහ. මින් මුල් ම ආයතනය 1859 දී ජේ. තර්ස්ටන් පූජකවරයා විසින් කොල්ලුපිටියේ පිහිටුවන ලදි.

(i) කාර්මික අධ්‍යාපනයේ ස්වරූපය නිගමනය කිරීමෙහි ලා මූලික වන කරුණු මොනවා ද?

(ii) අතීතයේ ශිල්පක්‍රම උකහා ගත්තේ කෙසේ ද?

(iii) කාර්මික පාසල් ආරම්භ කිරීමේ පරමාර්ථය කුමක් ද?

(iv) තම දේශපාලන බලය තහවුරු කර ගැනීමෙහි ලා බ්‍රිතාන්‍යයන් වඩා බලගතු සේ සැලකුයේ කුමක් ද?

(v) ගුරුවරයකු යටතේ විශාල ශිෂ්‍ය පිරිසකට පන්ති කාමරයක ඉගැන්වීමේ පිළිවෙත ආරම්භ වූයේ කුමන බලපෑමකින් ද?

(vi) මෙහි දැක්වෙන ආකාරයට කාර්මික අධ්‍යාපනයක අන්තර්ගත විය යුතු මූලික ලක්ෂණය කුමක් ද?

(ලකුණු $02 \times 6 = 12$ යි.)

[පස්වැනි පිටුව බලන්න.

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

පෙළ පොත් නිෂ්පාදනය සැලසුම් සහගත ව කළ යුත්තකි. මෙහි දී ඒ සම්බන්ධයෙන් අංශ තුනක් වැදගත් වෙයි. එනම්, තීරණ ගැනීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම යි. තීරණ ගනු ලබන්නේ භාෂා ඉගැන්වීමට අදාළ ආයතන යි. මෙය රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය හෝ පෞද්ගලික මට්ටමින් ක්‍රියාත්මක වන ආයතන විය හැකි ය. අදාළ බලධාරීන් විසින් පෙළ පොතට සම්බන්ධ භාෂා පාඨමාලාවේ අරමුණු, ඉගැන්වීමේ ක්‍රමවේද හා පෙළ පොත් සම්පාදනයේ ක්‍රියාවලිය පිළිබඳ මූලික තීරණ ගනු ඇත. පාඨමාලාවේ අරමුණු ජාතික, ආයතනික හෝ පෞද්ගලික විය හැකි ය.

භාෂා ඉගෙනීම ශිෂ්‍යයාගේ මූලික හා ඒකායන අරමුණ ය. එහෙත් භාෂා ඉගැන්වීමේ ක්‍රියාවලියට සම්බන්ධ ගුරුවරුන්ට හා බලධාරීන්ටත් සෙසු ආයතනවලටත් පොදු අරමුණු මෙන් ම, ස්වයං සංවර්ධනය, ප්‍රතිලාභ වැනි අරමුණු ද තිබිය හැකි ය. මේ සමහර ඒවා ප්‍රකාශිත මට්ටමේ පවතින ඒවා ය. අනෙක් ඒවා අප්‍රකාශිත හෝ සැඟවුණු මට්ටමේ ඒවා විය හැකි ය. ආයතනික මට්ටමෙන් ප්‍රතිලාභ ලබා ගැනීමත් කීර්තිය දියුණු කර ගැනීමත්, සමහර විට ඒවා සම්බන්ධයෙන් කිසියම් මතවාදයක් පැතිරවීමත් ගුරුවරුන් වශයෙන් වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමත් අප්‍රකාශිත අරමුණු විය හැකි ය. කුසලතා සංවර්ධනය, ආකල්ප සංවර්ධනය, ධනාත්මක චින්තනය පැතිරවීම ආදිය ප්‍රකාශිත අරමුණු අතර තිබිය හැකි ය. මේ තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳ සලකා බලන විට මධ්‍යම මට්ටමේ බලධාරීන් හා ගුරුවරුන් මඟින් එය සිදුවන බව නිරීක්ෂණය කළ හැකි ය.

(ලකුණු 13 යි.)

**3.** දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300-350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) ලෝක සාමය උදෙසා ජගත් සංවිධාන සතු වගකීම
(ii) ශ්‍රී ලංකාවේ ළමා නාට්‍ය ප්‍රවර්ධනය කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග
(iii) කඩිනම් විසඳුම් සෙවිය යුතු ශ්‍රී ලංකාවේ ළමා මන්ද පෝෂණය
(iv) අධ්‍යාපන ප්‍රතිපත්ති සහ රැකියා වෙළෙඳපොළ
(v) වර්තමාන ශ්‍රී ලාංකේය දේශපාලනය හා තරුණ ප්‍රජාව

(ලකුණු 25 යි.)

**4.** (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) කොග්ගල මහා ප්‍රාඥයා නොහොත් මාර්ටින් වික්‍රමසිංහ 'ගම්පෙරළිය' ලිව්වේ ය.
(ii) අලින් සඳහා වෙන් කරන ලද අනාථාගාරයක් පින්නවල ඇත.
(iii) කුමාරතුංග මුනිදාස ව්‍යාකරණඥයෙක් ද පද්‍ය රචකයෙක් ද වෙති.
(iv) සතුරන් පැන යද්දී සොල්දාදුවෝ පසුපසින් හඹා ගියහ.
(v) මවුවරුන් වනාහි ළතෙත් සිතුවිලි ඇත්තෝ වෙති.

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) දානපතියා මාතෘ නිවාසයට මුල්ගල තබයි.
(ii) දුප්පත් ස්ත්‍රිය අසරණ දැරියක පෝෂණය කළා ය.
(iii) විචාරකයෝ භාරතීය දාර්ශනිකයන් අගය කරති.
(iv) නියෝජිතයෝ එකී පර්යේෂණය සඳහා මා තෝරා ගත්තෝ ය.
(v) භක්තිවන්තයෝ දෙවියන් අදහති.

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) (ගොවියෝ/ගොවියන්) සුදුසු කාලය බලා බීජ (වපුරති./වපුරනු ලබති.)
(ii) කීර්තිමත් (පුරාවිද්‍යාඥයක්/පුරාවිද්‍යාඥයෙක්) වූ පරණවිතාන ප්‍රකට (පර්යේෂකයෙක්/පර්යේෂකයකු) ද වෙයි.
(iii) විදේශ (නායකයෙක් හෝ නායිකාවක්/නායිකාවක් හෝ නායකයෙක්) නිදහස් උළෙලට සහභාගි (වන්නේ ය./වන්නෝ ය.)
(iv) (තෙදැත්තෝ ද බලැත්තෝ ද/ තෙදැත්තන් ද බලැත්තන් ද) සමාජයෙහි කලින් කල පහළ (වෙයි./වෙති.)
(v) සමහරු (දේශමාමකයන්/දේශමාමකයෝ) සේ ජනතාව ඉදිරියේ පෙනී (සිටියි./සිටිති.)

(ලකුණු 05 × 3 =15 යි.)

[හයවැනි පිටුව බලන්න.

**5.** පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි **අනු-අංගය** දක්වන්න.

(i) **ගල්කැටයම්** පෙළින් අලංකෘත මහා ප්‍රාසාදයෝ නභෝ **ගර්භයෙහි දීප්තිමත්** ව බැබළෙති.
(ගල්කැටයම් - සමාස, ගර්භයෙහි - විභක්ති, දීප්තිමත් - තද්ධිත)

(ii) දරිද්‍රතාවෙන් **පෙළුණු ශිෂ්‍යශිෂ්‍යාවෝ ඔවුනොවුන්** අතර ආහාර බෙදා ගනිති.
(පෙළුණු - කෘදන්ත, ශිෂ්‍යශිෂ්‍යාවෝ - සමාස, ඔවුනොවුන් - සන්ධි)

(iii) **නිලුපුලින්** නෙතු ද නාදල්ලෙන් **රතදර** ද දැක්වූ **අංගනාවෝ** ඔබ මොබ සරති.
(නිලුපුල් - සන්ධි, රතදර - සමාස, අංගනාවෝ - විභක්ති)

(iv) **බලවන්තයන් මෙන්** ම ධනවන්තයෝ ද මේ දුර්භික්ෂ කාලයෙහි පීඩාවට පත් **වෙති.**
(බලවන්තයන් - විභක්ති, මෙන් - නිපාත, වෙති - ක්‍රියා)

(v) **ලේකම්තුමා** අංක 27 **දරන** චක්‍රලේඛය **උපුටා** දැක්වී ය.
(ලේකම්තුමා - විභක්ති, දරන - කෘදන්ත, උපුටා - ක්‍රියා) (ලකුණු $03 \times 5 = 15$ යි.)

**6.** (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස් තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(i) රටෙහි ඉදිරි ගමන්මග පිළිබඳ තොරතුරු ඇතුළත් කරමින් කථිකයා තම ...................... දේශනය පැවැත්වී ය.

(ii) මිත්‍ර ...................... පෙරටු කොට එන සතුරන් හඳුනා ගත යුතු ය.

(iii) ඒ ...................... දෙසුම සැමගේ නැණ-නුවණ වැඩී ය.

(iv) ශ්‍රාවක-ශ්‍රාවිකාවෝ තම ශාස්තෘවරයා කෙරෙහි භක්ති ...................... උපදවා ආදර ගෞරව දක්වති.

(v) එකල සොහොයුරු ...................... අන් සියල්ල පරයා නැඟී සිටියේ ය.

(vi) මත් රකුසා නොයෙක් ...................... ගෙන දැයේ දරුවන් නොමඟට හරවයි.

(වෙස්, ව්‍යක්ත, පෙම, වේශය, හරවත්, ප්‍රේමය) (ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ආ) පහත දක්වා ඇති පද සන්ධි කර ලියන්න.

(i) මඟ + පැහැරීම (ii) සත් + දවස (iii) ආප්ත + උපදේශ

(iv) නන් + අරුත් (v) මූල + අක්ෂර (vi) වහර + අනුසෙරෙන්

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ඉ) **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) "**මල්ලියේ,** මල්ලි දැන් ද ආවේ?" **අක්කා** ප්‍රශ්න කළා ය.

(ii) රතු **සාරියකින්** සැරසුණු මැණිකා **මුහුණෙහි** පුයර තවරා ගත්තා ය.

(iii) **රාළහාමිගේ** රළු **කටහඬ** මෙන් ම ස්වරූපය ද වෙනස් විය. (ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන කොටස නැවත ලියන්න.

නාටිකාංගනාවෝ සභා ගර්භයට පිවිස මන්දහාසය නංවා අත් පා තාලානුරූපී ව නගා නර්තනය පටන් ගත්හ. ප්‍රේක්ෂකයෙනි මෙවන් රංගනයක් කවර කලෙක වේ ද අහා ඒ රංගශෝභාව විචිත්‍ර ය දර්ශනීය ය; රමණීය ය.

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) "අපි රට වෙනුවෙන් අප්ගේ වැටුප පරිත්‍යාග කරමු" යි නායකයෝ කීහ.

(ii) "මඟිය, මේ මාර්ගයෙන් නික්මෙන්න" යි තාපසයා උපදෙස් දුන්නේ ය.

(iii) "මම හෙට ශ්‍රී ලංකාවෙන් පිට ව යමි" යි විදේශිකයා පැවසී ය. (ලකුණු $01 \times 3 = 03$ යි.)

**7.** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පෘතුගීසි **ආක්‍රමණිකයාගේ** තාඩන-පීඩනයන්ගෙන් ලංකාවාසී ජනතාව **අතිශය** ඛේදනීය ඉරණමකට මුහුණ දුන් **අවධියක්** සේ සීතාවක රාජසිංහ රාජ්‍ය සමය හැඳින්විය හැකි ය. ප්‍රතාපවත් රණශූරයකු, **අභීත** නායකයකු සේ කීර්තිමත් නාමයකට හිමිකම් කී රාජසිංහයෝ පරදේශීන් ශ්‍රී ලංකාද්වීපයෙන් පලවා හැරීමේ සටන ඇරඹූහ. ඇත්අස්රියපාබළ යන චතුරංගිනී සේනාවෙන් සමලංකෘත මහ පිරිස මුල්ලේරියා වෙල්යාය අවට කඳවුරු බැඳ ගත්තේ විදේශීය සතුරන් මුලිනුපුටා දැමීමේ ස්ථිර අධිෂ්ඨානයෙනි. ලාංකිකයාගේ භාග්‍යයකට මෙන් පෘතුගීසීන්ට තම රටින් කිසිදු **අමතර** උදව්වක් නො ලැබිණි. යුද්ධායුධ හිඟ විය; ආහාර පාන **අවසන්** විය; කොළඹ කොටුවේ බළල් මස් පවා ගිනි ගණන් විය. ඔවුන් රාජසිංහයන්ගේ යුද්ධ වික්‍රමය හමුවේ කෙතරම් හීන-දීන පරාජිත තත්ත්වයට පත් වී ද යත්, මුල්ලේරියා වෙලේ වතුර ඔවුන්ගේ රුධිරයෙන් රත් පැහැ ගැන්වුණේ ය. එමනිසා රාජසිංහ නාමය **අද්විතීය** වූවක් සේ ලංකා යුද්ධ ඉතිහාස වංශ කථාවේ රනකුරින් ලියැවුණේ ය.

(i) ඡේදයේ **තද කළු** අකුරින් මුද්‍රිත වචන අකාරාදි පිළිවෙළින් ලියන්න.

(ii) මුලිනුපුටා, යුද්ධායුධ, රනකුරින් යන වචන විසන්ධි කරන්න.

(iii) දකාරාර්ථ සමාස පද **තුනක්** ඡේදයෙන් උපුටා දක්වන්න.

(iv) පෘතුගීසි, රාජසිංහයෝ, මුල්ලේරියා යන වචනවල යෙදී ඇති පිළි වෙන වෙන ම ලියන්න.

(v) මෙම ඡේදයෙහි ඇතුළත් ඝෝෂ හා අඝෝෂ මහාප්‍රාණ **දෙකක්** අන්තර්ගත වචනයක් ලියන්න.

(ලකුණු 03 × 5 =15 යි.)

**8.** පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) ස්වර සන්ධිය

(ii) ආශීර්වාද ක්‍රියාව

(iii) අව්‍යය සමාසය

(iv) උපසර්ග

(v) භාව කාරක කෘදන්ත

(ලකුණු 05 × 3 =15 යි.)

* * *